**මාසික විශේෂාංගය - පුරාවිද්‍යාව**

# වාස්තු විද්‍යා සංරක්ෂණය යනු කුමක් ද?

වැඩබලන අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා සංරක්ෂණ)

**ප්‍රසන්න රත්නායක**

පෞරාණික භාවය නිසා හෝ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ අනුව හෝ යම් වාස්තු විද්‍යාත්මක නිර්මාණයක්, යම් සමාජයක් තුළ වැදගත් භාවයක් උසුලයි නම් එම නිර්මාණය ආරක්ෂා කර ගැනීම ජාතියේ වගකීමක් ලෙස සැලකේ. ඒ අනුව විවිධාකාර වාස්තු විද්‍යාත්මක ශේෂයන් ආරක්ෂා කර ගැනීම සඳහා පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ වාස්තු විද්‍යා අංශය ක්‍රියාත්මකව සිටී.

මෙම සංරක්ෂණ ක්‍රියාවලිය තුළින් වසර සිය ගණනකට පෙර අප සමාජයේ ජීවත් වූ පුද්ගලයින් ගේ සමාජයීය, ආර්ථික, ආගමික, දේශපාලනමය ව්‍යූහයන් කෙබඳුවී-දැයි අවබෝධයක් ලබා ගත හැක. එය යම් ජාතියක ඉදිරි පැවැත්මට පූර්වාදර්ශයක් වනවා මෙන් ම, එම ජාතියේ අභිමානයට ද හේතු වේ. එබැවින් නියමිත ආකාරයට ගොඩනැගිලි සංරක්ෂණය කිරීම පිළිබඳව සංරක්ෂකයින් ක්‍රියා කළ යුතු වේ. යම් හෙයකින් වැරදි ආකාරයක සංරක්ෂණයක් සිදු කළ හොත් එය අනාගත කාලය පුරාම වැරදි අවබෝධයක් ලොවට පෙන්වා දෙයි.

වාස්තු විද්‍යාත්මක සංරක්ෂණයක් සඳහා ක්‍රියාත්මක වන්නේ කෙසේ ද? ඕනෑම රටක පුරාවිද්‍යාත්මක වාස්තු නිර්මාණයන් විවිධාකාර භාවිතයන් සඳහා යොදා ගෙන ඇත. මූලික වශයෙන්, රාජකීය, ආගමික, නේවාසික ගොඩනැගිලි මෙන් ම, සොහොන් බිම් ආදී අනෙකුත් නිර්මාණයන් ද මේ අතර වේ. ප්‍රධාන වශයෙන් සංරක්ෂණය සඳහා ක්‍රියාත්මක වීමේ දී ගොඩනැගිල්ලේ ඓතිහාසික පසුබිම පිළිබඳව අධ්‍යයනය කළ යුතු වේ. එයින්, සංරක්ෂකයා තම අත්දැකීම් ඔස්සේ ගොඩනැගිල්ලේ යථා ස්වරූපය මෙන් ම, භාවිත තාක්ෂණය සහ ද්‍රව්‍ය පිළිබඳ අවබෝධයක් ලබා ගනී. මේ තුළින් සංරක්ෂණය පිළිබඳ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක අවබෝධයක් ද ලැබෙන අතර, දෙවනුව ගොඩනැගිල්ලේ භෞතික සැලසුම් සකස්කර ගත යුතු වේ. ඒ තුළින් සැබෑ වශයෙන් ම ගොඩනැගිල්ලේ මුල් ස්වරූපය කෙබඳු වී දැයි අවබෝධයක් ලබා ගත හැකි වේ. නවීන තාක්ෂණයට අනුව, ඡායාරූප, වීඩියෝ රූප ආදිය මගින් ලේඛන ගත කර තබා ගැනීම ද සිදු කෙරේ. ඉන් පසුව සංරක්ෂකයා විසින්, සංරක්ෂණ සැලසුම් සහිත සංරක්ෂණ යෝජනාව ඉදිරිපත් කර සාකච්ඡාවට භාජනය කරනු ලැබ සංරක්ෂණ ක්‍රියාවලිය ආරම්භ කරයි.



ක්‍රි. ව. 12 සියවසේ ලෝකඩ නටරාජ පිළිමයක්



ක්‍රි. ව. 12 සියවසේ ලෝකඩ ගණදෙවි පිළිමයක්

ගොඩනැගිලි සංරක්ෂණයේ දී මූලික වශයෙන් "අවම මැදිහත්වීම" නමුත් සංකල්පයට මුල්තැන දිය යුතු වේ. මෙහි දී ගොඩනැගිල්ල තවදුරටත් හානියට පත් වීමට ඉඩ නොදී තිබෙන ආකාරයට ආරක්ෂා කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. නමුත් යම් ගොඩනැගිල්ලක් එලෙසම පවත්වා ගැනීම තුළින් වසර දෙක තුනක කාලයක දී තිබූ තත්ත්වයටත් වඩා හානියට පත් වේ නම් එය අවම මැදිහත්වීමේ සංකල්පයෙන් ඔබ්බට ගොස් සංරක්ෂණය කළයුතුව ඇත. විශේෂයෙන් දැවමය ගොඩනැගිලි සංරක්ෂණයේ දී මෙය නදින් ම බලපායි.

කෙසේ නමුදු යම් ගොඩනැගිල්ලක් පසුකාලීනව සිතා මතා සිදු කරන ලද වෙනස් කිරීම් හේතුවෙන් මුල් ස්වරූපය වෙනස් වී ඇත්නම් එය යථා තත්ත්වයට පත් කර සංරක්ෂණය කිරීම සංරක්ෂකයා ගේ යුතුකමක් වනු ඇත.

ශ්‍රී ලංකාව වැනි දියුණු ශිෂ්ටාචාරයක් හිමිව තිබූ රටක් පිළිබඳව සැලකීමේ දී පැරණි වාස්තු විද්‍යාත්මක සාධක සහිත නිර්මාණයන් රැක ගැනීම අතිශය වැදගත් කටයුත්තක් සේම, භාරදූර කටයුත්තක් ද වේ.

ප්‍රධාන වශයෙන් ම මේ පිළිබඳව ජනතාව තුළ අවබෝධයක් ඇති කළ යුතු අතර, ඒ තුළින් වඩාත් යහපත් සංරක්ෂණයක් සිදු කළ හැකි වනු ඇත. ❑